**බුරුමයෙන් හාල් නොදෙන නිසා සියමෙන් හොයන්නලු. (1955, January 3). Lankadeepa.**

# බුරුමයෙන් හාල් නොදෙන නිසා සියමෙන් සොයන්නලු

## දරු උපත් අඩු කිරීමට උත්සාහ ගන්නා ලෙස ඉල්ලීමක්

ලංකාදීප 3/1/52

2 වෙනිද මැල්සිරිපුර දිය

"මින්පසු ලංකාවට හාල් නොඑවන බව බුරුමයෙන් දන්වා එවා තිබෙන හෙයින් සියමට ගොස් හාල් ලබාගන්නා ක්‍රමයක් සලසා එන ලෙස අගමැතිතුමා තමාට අද දවල් නියම කළ බව 29 වෙනිද පවත්වන ලද කරඳගොල්ල ග්‍රාමසංවර්ධන සමිතියේ පස්වන සංවත්සර මහා සම්මේලන සභාවේ මූලාසනය ගත් මංමාවත් හා කර්මාන්ත ඇමතිවර සර් ජෝන් කොතලාවල මහතා ප්‍රකාශ කලේය.

සභා ශාලාව ඉදිරිපස සාද තිබුණ අලංකාර තොරණ යටදී බුලත් හුරුළු දීමෙන් ආර්. ඇම්. මුතු බණ්ඩා මහතා විසින් ඇමතිවරයා ඇතුළු අමුත්තෝ පිළිගනු ලැබූහ.

ඇමතිවරයා මෙසේද කීය. "ගම්වැසියන්ට ඉඩම් අවශ්‍ය වූ පලියට පුද්ගලික ඉඩම් බලහත්කාරයෙන් ගෙනදීමට ආණ්ඩුවට පුළුවන්කමක් නැත. ඉංග්‍රීසීන්ට බලය තිබුණ කාලයේදී ආණ්ඩුවේ ඉඩම් වෙන්දේසියේ විකුණූ තමුත් සේනානායක මහතා බලයට පත්වුනාට පසු ඒ නීති වෙනස් කෙළෙමු. ගල් ඔය සහ මින්නේරි ව්‍යාපාර මඟින් දැන් යළිත් ඉඩම් නැති අයට ඉඩම් බෙදා දීමට පටන්ගෙන ඇත."

"ඉංග්‍රීසිකාරයන්ගේ ඉඩම් බලහත්කාරයෙන් ගත්තොත් අපේ තේ, රබර් සහ පොල් ඒ අයට විකිණීමට නොහැකි වෙසි. පසුගිය කාලයේදී ඉන්දියානුන් සතුව තිබුණ බුරුමයේ ඉඩම් රාජසන්තක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ රටේ නායකයන්ට වෙඩි පහරවල් කන්නට පවා සිදුවූ බව අපි දනිමු."

### හොරුන්ට කප්පම් දී හාල් ගෙනෙති

මුදු හොරුන්ට හා තක්කඩියන්ට කප්පම් දී අපට දැන් බුරුමයෙන් හාල් ගෙනෙන්නට සිදුවී තිබෙන්නේ ඒ රටේ පාලනය නොසුදුස්සන් අත තිබෙන නිසයි. බුරුමයේ දැනට පවතින සිවිල් යුද්ධය ඉතා කණගාටුදායකය. එනිසා මේ රට පාලනය කිරීමට නොසුදුසු අයට නොදීමට තමුන්නාන්සේලා මතක තබාගත යුතුයි. තමුන්නාන්සේලාගේ ඡන්දය ගන්නා තෙක් සමහර අය පුද්ගලික ඉඩම් රාජසන්තක කිරීමට පොරොන්දු විය හැකියි. ඒ අය කියන තරම් ඒ කටයුත්ත කිරීම පහසු නැත."

### උත්පත්ති පාලනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ ප්‍රධාන පරිපාලක තැන්පත් පුලිපාන මහතා කතා කරමින් ලංකාවේ පමණක් නොව ලෝකයේ සෑම රටකම ජනගහනය ඉතා වේගයෙන් වැඩිවෙන බවත්, ලංකාවේ පමණක් වසකට ලක්ෂ 2 ක් පමණ වැඩිවෙන බවත් පවසා, දරු උත්පත්ති අඩු කිරීමට උත්සාහ ගන්නා මෙන් සභාවේ උන් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයෙන් ඉල්ලා සිටියේය.

කොතලාවලමහතාප්‍රදේශවාසීන්ගේ පියා වශයෙන් සලකා, දරුවන්ගෙන් පියාට සිදු විය යුතු යුතුකම් ඉටු කිරීමට මතක තබාගන්නා මෙන් ඒ මහතා ඉල්ලීය.

### ඉල්ලීම

තැවිල්පාම් නමැති අක්කර 400 ක ඉඩම හා බණ්ඩිපොළ වත්තද රජය මඟින් මිලට ගෙන ගම්වැසියන්ට බෙදා දිය යුතුයයි සාමාජිකයෝ ඇමතිවරයාගෙන් ඉල්ලා සිටියහ.

සම්මාදන විනිශ්චයකාර පී. සී. ද සිල්වා, ඇස්.බී.රෝගුස් අප්පුහාමි, කේ. බී. වීරසූරිය ඇම්. බී. රත්නායක, බී. ඇම්. විලියම් අප්පුහාමි යන මහත්වරුද කථා කළහ.